# ආරක්ෂක අමාත්‍යාංශය
# பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

අංක. 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව.
இல. 15/5, பாலதக்ச மாவத்தை, கொழும்பு 03, இலங்கை.
No. 15/5, Baladaksha Mawatha, Colombo 03, Sri Lanka. Website : www.defence.lk

තැ. පෙ. / த. பெட்டி / P.O. Box 572
දුරකථන / தொலைபேசி / Telephone 2430860-9, 2430870-8
ලේකම් / செயலாளர் / Secretary: දුර./தொ./Tel. : 011 2381154; ෆැක්ස්./பெ./Fax.: 011 2541529; වි. තැපැල./மி.அ./Email : secdefence@defence.lk


මගේ අංකය / எனது இல / My No: MOD/DEF/GS/COM/1/SLA (1)

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2019.08.16

NAVAL HEADQUARTERS
DG(B&F)
20 AUG 2019
SECRETARIAT

DIRECTOR GENERAL
DGBF 25
21 AUG 2019
BUDGET & FINANCE

යුද්ධ හමුදාධිපති
නාවික හමුදාධිපති
ගුවන් හමුදාධිපති

## රණවිරු වැන්දඹු බිරිඳ නැවත විවාහ වීමේදී වන්දි මුදල් ගෙවීම.

ශිර්ෂගත කරුණ සම්බන්ධයෙන් අංක අමප/07/2081/305/082 හා 2007.11.21 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණය හා බැඳේ.

02. අංක අමප/07/2081/305/082 හා 2007.11.21 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණයෙන් සැලසී ඇති ප්‍රතිපාදන අනුව යුධමය වාතාවරණය පැවති වකවානුවේ ත්‍රස්තවාදි ක්‍රියා හේතුවෙන් මියගිය රණවිරුවන්ගේ වැන්දඹු බිරින්දෑවරුන් නැවත විවාහ වීමේදී වැන්දඹු බිරිඳ වෙත වන්දි මුදලක් හිමිගැන්වීමට හැකියාව පවති.

03. ඒ අනුව, රණවිරු වැන්දඹු බිරින්දෑවරුන් වෙත මෙම සහනය හිමිගැන්වීමේදි පැවති ගැටළු සම්බන්ධයෙන් නීතිපති විසින් අංක ඊ/289/2014 හා 2015.03.11 දිනැති ලිපියක් මඟින් මෙම අමාත්‍යාංශය වෙත උපදෙස් ලබාදී ඇත.

04. රණවිරු වැන්දඹු බිරිඳක් නැවත විවාහයක් සිදුකරගන්නා බවට හැකි මුල්ම අවස්ථාවේදී දැනුම් දී ඇති අවස්ථාවකදී පමණක් මෙම වන්දි මුදල වැන්දඹු බිරිඳ වෙත හිමිගැන්වීමට උචිත බව ඉහත ලිපිය මඟින් දන්වා ඇත.

05. නමුත්, එලෙස විවාහ වීමට ප්‍රථම ඒ බව දැනුම් දුන් බව සනාථ කිරිම සඳහා ඔබ මූලස්ථානය මඟින් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කරනු ලබන ලිපි කූඨ ලෙස සකස්කළ ලේඛන බවට තහවුරු වී ඇත. එබැවින්, එකී තත්ත්වය මගහරවා ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

I. වැන්දඹු බිරිඳක නැවත විවාහයකට ඇතුළත්වන බව තමා වැටුප් හා දීමනා ලබන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ද එම ලිපියේ ප්‍රගමන පිටපත් ඔබ වෙත හා මෙම අමාත්‍යාංශය වෙත ද ලියාපදිංචි තැපැලෙන් යොමුකරන ලෙස වැන්දඹු බිරින්දෑවරුන් හට ලිඛිතව දැනුම් දීම.

06. මේ සම්බන්ධයෙන් ඔබ ලබාදෙන සහය ඉතා අගය කොට සලකමි.

විජිතා මායාදුන්න
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආ-III)

අත්:කළේ: අනුරාධ විජේකෝන්
අතිරේක ලේකම් (ආරක්ෂක)
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.